www.agaram.lk

49573

OL/2018/50-S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

නාට්‍ය හා රංග කලාව I, II
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

2018.12.11 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## නාට්‍ය හා රංග කලාව I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

- පහත දැක්වෙන කවි, සිංදු හා ගීත ඇසුරෙන් අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) දෙමව්පියන් වැඳ අවසර අරගෙ න
බත බුලතින් රස බොජුන් කවා ගෙ න
පව් පින් අරවා උන්නේ වෙන වෙ න
සිංහල දේසෙට එන්නට නික්මු න

(ii) මම් වගේ පේඩි කතෙක් මනා
දුටුවා ද ලොවේ රුසිරෙන් දිනා
මව්පියො නිදහස් වෙන්න ටා
මාව දුන්නයි නාකි වූ හමෙකු ටා

(iii) ගෙදර ගොහින් මක් කරම් ද?
දීග කලක කොහොම යන්නෙ
ගෙදර තමයි ඉන්න වෙන්නෙ
පාරෙ බැහැල කොහොම යන්නෙ

(iv) ඇන්නැවෙ මේ මල කෝලම්
පාරෙ යන්නට බැහැ මුන්දැ සමගින්
මව්පියෝ නිදහස් වෙන්න සිතා බැඳ
දුන්නේ ය මා මේ අඟුටුමිටියටා //

**1.** නූතන නාට්‍යයකට අයත් ගීතයක් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

**2.** ශ්‍රී ලංකාවේ පැරණි ගැමි නාටකයකට අයත් කවියක් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

**3.** නාඩගම් සම්ප්‍රදායට අයත් නාට්‍යයක සිංදුවක් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

**4.** කෝලම් චරිතයක් විසින් ගැයෙන කවියක් වන්නේ,
(1) i ය. (2) ii ය. (3) iii ය. (4) iv ය.

[දෙවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**5.** නෘත්ත යනු,
(1) අංග වික්ෂේප භාවිත කරන භාවයක් දැක්වෙන නැටුමකි.
(2) අංග වික්ෂේප භාවිත කරන අර්ථයක් සහිත නැටුමකි.
(3) අංග වික්ෂේප භාවිත කරන රිද්මයානුකූල නැටුමකි.
(4) අංග වික්ෂේප සහිත ශෝභමාන දෘශ්‍ය රූපයකි.

**6.** ප්‍රාසංගික කලාව යනු,
(1) සංගීතය, නර්තනය, චිත්‍ර හා සැරසිලි කලාවන් ගේ එකතුවෙන් බිහි වන දෘශ්‍ය කලාවකි.
(2) ප්‍රේක්ෂක පිරිසක් අභිමුඛයෙහි ඉදිරිපත් කැරෙන සජීවී කලාවකි.
(3) නළු නිළියන් විසින් රූපවාහිනී මාධ්‍යයෙන් ඉදිරිපත් කරන නර්තන ප්‍රසංගයකි.
(4) රූපවාහිනී රියැලිටි වැඩසටහන් මගින් ඉදිරිපත් කරනු ලබන සංගීත හා නර්තන ප්‍රසංගයකි.

**7.** නාට්‍යයක මූලික ලක්ෂණයක් වන්නේ,
(1) නර්තනය සමග සංගීතය භාවිතයට ගැනීම ය.
(2) මිනිස් ක්‍රියාවන් අනුකරණය කර දැක්වීම ය.
(3) ජීවමාන සංගීතය භාවිතයට ගැනීම ය.
(4) රංගභූමි අලංකරණය සඳහා පසුතල යොදාගැනීම ය.

**8.** නාට්‍ය කලාව අනෙකුත් කලාවන් ගෙන් වෙනස් වන්නේ,
(1) රංගාලෝකය සහ පසුතල දර්ශන යොදාගන්නා බැවිනි.
(2) රංගාලෝකය සහ ගගනිකාව යොදාගන්නා බැවිනි.
(3) පසුතල දර්ශන සඳහා චිත්‍ර වස්ත්‍ර යොදාගන්නා බැවිනි.
(4) සතර අභිනය රංගනය සඳහා යොදාගන්නා බැවිනි.

**9.** රූපණය සඳහා මූලික වශයෙන් අවශ්‍ය වන්නේ,
(1) අනුකරණය, අනුරූපණය සහ රංග ක්‍රීඩාවයි.
(2) අනුකරණය, අනුරූපණය සහ අංග රචනයයි.
(3) අනුකරණය, අනුරූපණය සහ සමාරෝපයයි.
(4) අනුකරණය, අනුරූපණය සහ රංගාලෝකයයි.

**10.** රංග ක්‍රීඩාවන්හි අරමුණ වන්නේ,
(1) ක්ෂණික තීරණ ගැනීමේ හැකියාව දියුණු කිරීම ය.
(2) ක්‍රීඩා කෞශල්‍යය දියුණු කිරීම ය.
(3) හඬ උච්චාරණ හැකියාව දියුණු කිරීම ය.
(4) පෙළ රචනා කිරීමේ හැකියාව දියුණු කිරීම ය.

**11.** ක්ෂණික නිරූපණ මගින්,
(1) කථන හැකියාව දියුණු කරගත හැකි ය.
(2) අභිරූපණ හැකියාව දියුණු කරගත හැකි ය.
(3) පරිකල්පන හැකියාව දියුණු කරගත හැකි ය.
(4) සංවේදන හැකියාව දියුණු කරගත හැකි ය.

**12.** නළුවරණය මගින් සිදු කළ යුත්තේ,
(1) ජනප්‍රිය නළු-නිළියන් ම තෝරාගැනීමයි.
(2) හිතවත්කම අනුව නළු-නිළියන් තෝරාගැනීමයි.
(3) ගායන හැකියාව ඇති අය පමණක් ම තෝරාගැනීමයි.
(4) ඒ ඒ චරිතයට ගැළපෙන අය පමණක් තෝරාගැනීමයි.

**13.** අංග රචනය සඳහා භාවිත කෙරෙන ද්‍රව්‍යයක් වන්නේ,
(1) බයින්ඩර් ගම් ය. (2) ප්ලැටිග්නම් ය. (3) බ්‍රිස්ටල් බෝඩ් ය. (4) ක්‍රේප් හෙයා(ර්) ය.

[තුන්වැනි පිටුව බලන්න.

agaram.lk
Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !

www.agaram.lk



- පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| මුල් කෘතිය | රචකයාගේ නම | පරිවර්තිත කෘතියේ නම | පරිවර්තකයා |
|---|---|---|---|
| කොකේසියන් චෝක්-සර්කල් | ක | හුණුවටයේ කතාව | හෙන්රි ජයසේන |
| ග | ඇන්ටන් චෙකොව් | චෙරිවත්ත | මැන්දිස් රෝහණධීර |
| ඩොල්ස් හවුස් | හෙන්රික් ඉබ්සන් | ජ | සුනිල් විජේසිරිවර්ධන |

**14.** ඉහත වගුවේ '**ක**' කොටුවට ඇතුළත් විය යුතු විදේශීය නාට්‍යකරුවා ගේ නම කුමක් ද?
(1) ෂෝන් පෝල් සාත්‍රෙ (2) ටෙනසි විලියම්ස් (3) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (4) මැක්සිම් ගෝර්කි

**15.** ඉහත වගුවේ '**ග**' කොටුවට ඇතුළත් විය යුතු විදේශීය මුල් නාට්‍ය කෘතියේ නම කුමක් ද?
(1) ද ෆාදර් (2) චෙරි ඕර්චාර්ඩ් (3) ද ඩ්‍රැගන් (4) ද පබ්ලික් එනිමි

**16.** ඉහත වගුවේ '**ජ**' කොටුවට ඇතුළත් විය යුතු පරිවර්තිත නාට්‍යයේ නම කුමක් ද?
(1) වෙස් මුහුණු (2) හිරු නැති ලොව (3) බෝනික්කි ගෙදර (4) ජන හතුරා

**17.** දික්තල කාලගෝල නාට්‍යයේ චරිතවලට වේෂභූෂණ නිර්මාණය කළ යුත්තේ,
(1) ජාතක කතාවල සඳහන් වන විස්තරවලට අනුව ය.
(2) ලෝකධර්මී රංග ශෛලියට අනුව ය.
(3) නූර්ති රංග ශෛලියට අනුව ය.
(4) නාට්‍යධර්මී රංග ශෛලියට අනුව ය.

**18.** අභිරූපණ රංගනයක් සඳහා,
(1) ඕනෑ ම සිදුවීමක් යොදාගත හැකි ය.
(2) ඕනෑ ම අවස්ථාවක් යොදාගත හැකි ය.
(3) වාචික අභිනය ද යොදාගත හැකි ය.
(4) නරඹන්නාට මවාගත හැකි සිදුවීමක් නිරූපණය කළ යුතු ය.

**19.** නාට්‍යෝපකරණ,
(1) නළුවන් අත දරා සිටින දේවලට පමණක් සීමා වේ.
(2) වේදිකා පරිපාලක ගේ අභිමතය අනුව සකස් වේ.
(3) සෑම ශෛලියකට ම අයත් නාට්‍යවල දැකිය හැකි ය.
(4) නාට්‍ය පෙළ හෝ ශෛලියට අනුව සකස් වේ.

**20.** සිරුර සම්බන්ධ සංවේදන අභ්‍යාස මගින්,
(1) යමක් ආවර්ජනය කොට එය කුමක් දැයි පැවැසිය හැකි ය.
(2) යමක් ස්පර්ශ කොට එය කුමක් දැයි අවබෝධ කරගත හැකි ය.
(3) යමක් ආඝ්‍රාණය කොට එය තිබෙන තැන හඳුනාගත හැකි ය.
(4) යමක් රස බලා එය කුමක් දැයි පැවසිය හැකි ය.

**21.** නාට්‍යයකට සංගීතය අවශ්‍ය වන්නේ,
(1) ජවනිකා වෙනස්වීම ප්‍රේක්ෂකයන්ට හැඟවීම සඳහා ය.
(2) සංවාද අතරතුර ඇති නිහඬ බව නැති කර ගැනීම සඳහා ය.
(3) සිදුවීම් හා අවස්ථා උද්දීපනය කිරීම සඳහා ය.
(4) කතාවේ ඒකාකාරී ගලායාම මග හරවාගැනීම සඳහා ය.

**22.** රංග භූමියක තිබිය යුතු මූලික අවශ්‍යතාවක් වන්නේ,
(1) පසුතල ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් අවකාශයක් තිබීම ය.
(2) සමතලා භූමියක් හා ප්‍රමාණවත් අවකාශයක් තිබීම ය.
(3) සංගීත ශිල්පීන් සඳහා විශේෂ ස්ථානයක් තිබීම ය.
(4) නාට්‍යෝපකරණ තැන්පත් කිරීමට ප්‍රමාණවත් අවකාශයක් තිබීම ය.

[හතරවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk




49573

- පහත දැක්වෙන ඡායාරූප ආශ්‍රයෙන් **23** සිට **26** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


ක


ග


ජ


ච

**23.** '**තාරාවෝ ඉගිලෙති**' නාට්‍යයට රංගනයෙන් දායක වූයේ කවුද?
(1) ක (2) ග (3) ජ (4) ච

**24.** '**හුණුවටයේ කතාව**' නාට්‍යයෙහි ගායනයට හා රංගනයට දායක වූයේ කවුද?
(1) ක (2) ග (3) ජ (4) ච

**25.** කැලණි පාලම, ධවල භීෂණ හා ට්‍රෝජන් කාන්තාවෝ යන නාට්‍යවල රංගනයෙහි යෙදුණේ කවුද?
(1) ක (2) ග (3) ජ (4) ච

**26.** 'ජ' ඡායාරූපයෙන් දැක්වෙන නිළිය රඟ පෑ නාට්‍යයක් වන්නේ,
(1) 'ගුරුතරුව' ය. (2) 'විකෘති' ය. (3) 'තලමල පිපිලා' ය. (4) 'දික්තල කාලගෝල' ය.

**27.** නාට්‍යමය අවස්ථාවක් යනු,
(1) යම්කිසි කතා පුවතක් ඒ අයුරින් ම නිරූපණය කිරීමයි.
(2) යම්කිසි කතා පුවතක් රසවත් ව නිරූපණය කිරීමයි.
(3) සමාන අදහස් ඇති චරිතවල හැඟීම් නිරූපණය කිරීමයි.
(4) යම්කිසි ගැටුමක් සහිත සිද්ධියක් නිරූපණය කිරීමයි.

**28.** කෙටි නාට්‍යයක් යනු බොහෝ විට,
(1) දිගු නාට්‍යයක ජවනිකා කෙටි කර පෙන්වීමකි.
(2) දිගු නාට්‍යයක ජවනිකා අඩු කර පෙන්වීමකි.
(3) ඒකාංක නාට්‍යයකි.
(4) චරිත දෙකක් පමණක් ඇති නාට්‍යයකි.

**29.** විජය නන්දසිරි වඩාත් ප්‍රකට වූයේ,
(1) කෙටි නාට්‍ය රංගනය සඳහා ය. (2) හාස්‍ය රංගනය සඳහා ය.
(3) දුෂ්ට චරිත නිරූපණය සඳහා ය. (4) චිත්‍රපට අධ්‍යක්ෂණය සඳහා ය.

**30.** රාත්‍රී කාලයේ සොහොන් භූමියක හොල්මන් දර්ශනයක් මැවීමට උපකාර වන්නේ,
(1) ධාරාලෝක පහන් ය. (2) යොමු පහන් ය.
(3) විවිධ වර්ණ පහන් ය. (4) අල්ට්‍රාවයලට් පහන් ය.

**31.** පින්තූර රාමු වේදිකාවක් මනඃකල්පිත ලෙස බොහෝ විට බෙදා දක්වනු ලබන්නේ,
(1) කොටස් හතරකට ය. (2) කොටස් හයකට ය.
(3) කොටස් නවයකට ය. (4) කොටස් දොළහකට ය.

**32.** නාට්‍යයක් රඟ දැක්වෙන මොහොතේ දී එහි සාර්ථකත්වයට අනිවාර්යයෙන් ම සිටිය යුත්තේ,
(1) නාට්‍ය පෙළ රචකයා ය. (2) නාට්‍ය සංවිධායකවරයා ය.
(3) නාට්‍ය ශාලා භාරකරු ය. (4) ප්‍රේක්ෂකයෝ ය.

**33.** නාට්‍ය අධ්‍යක්ෂවරයා ගේ ප්‍රධාන කාර්යයක් වන්නේ,
(1) නාට්‍ය පෙන්වීම සඳහා ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීමයි.
(2) නාට්‍ය පෙළ පදනම් කරගෙන නළු-නිළියන් පුහුණු කරවීමයි.
(3) නාට්‍යයට අවශ්‍ය නාට්‍යෝපකරණ හා වේශභූෂණ සැකසීමයි.
(4) නාට්‍යයට අවශ්‍ය සංගීතය පුහුණු කරවීමයි.

[පස්වැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**34.** පහතරට සම්ප්‍රදායට අයත් ශාන්තිකර්මයක් වන්නේ,
(1) කොහොඹා කංකාරිය ය. (2) සන්නි යකුම ය.
(3) වලියක් මංගල්‍යය ය. (4) පහන් මඩුව ය.

**35.** පත්තිනි පූජාව මුල්කොට ගෙන රඟ දැක් වුණු ගැමි නාට්‍යය කුමක් ද?
(1) කෝලම් (2) පාස්කු (3) නාඩගම් (4) සොකරි

**36.** නාඩගම් සම්ප්‍රදායට ආභාසය ලැබුණේ,
(1) කාමන්කූත්තු මගිනි. (2) තෙරුක්කූත්තු මගිනි. (3) කථකලි මගිනි. (4) කවි නාඩගම් මගිනි.

**37.** නූර්ති රචනා කළ නාට්‍යකරුවකු ලෙස සැලකෙන්නේ,
(1) වී. ක්‍රිස්තියන් පෙරේරා ය. (2) පිලිප්පු සිඤ්ඤෝ ය.
(3) චාල්ස් ද ආබෲව් ය. (4) චාල්ස් ඩයස් ය.

**38.** මිනර්වා නාට්‍ය සඳහා පුරෝගාමී වූ බී.ඒ.ඩබ්ලිව්. ජයමාන්නගේ නාට්‍ය ප්‍රධාන වශයෙන් සැලකෙන්නේ,
(1) අනුවර්තන නාට්‍ය වශයෙනි. (2) පරිවර්තන නාට්‍ය වශයෙනි.
(3) ස්වතන්ත්‍ර නාට්‍ය වශයෙනි. (4) අසම්මත නාට්‍ය වශයෙනි.

**39.** ජයලත් මනෝරත්න විසින් නිර්මාණය කරන ලද නාට්‍ය පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) සොක්‍රටීස්, ද්විත්ව, පුත්‍ර සමාගම, ගුරුතරුව
(2) මහගිරිදඹ, තලමල පිපිලා, අන්දරේලා, ගුරුතරුව
(3) රතුහැට්ටකාරී, තලමල පිපිලා, සොක්‍රටීස්, ද්විත්ව
(4) රතුහැට්ටකාරී, සොක්‍රටීස්, මෝදරමෝල, අන්දරේලා

**40.** විකෘති නාට්‍යය රචනා කිරීමේ අරමුණ වූයේ,
(1) වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වීමට නොහැකි වන දරුවන් ගේ ඛේදවාචකය පිළිබිඹු කිරීම ය.
(2) දරුවන් විභාග සමත් වී දෙමාපියන් සතුටු කිරීමට ගන්නා උත්සාහය පිළිබිඹු කිරීම ය.
(3) වැඩිහිටියන්ගේ අපේක්ෂා ඉටු කිරීම සඳහා බාල පරපුර කැපවන ආකාරය පෙන්නුම් කිරීම ය.
(4) ශ්‍රී ලංකාවේ යෞවනයන් විඳින පීඩාව හඬ ගා කීමට නාට්‍ය මාධ්‍යය යොදාගැනීම ය.

* *

[හයවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**50 S I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்**
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

**නාට්‍ය හා රංග කලාව I, II**
நாடகமும் அரங்கியலும் I, II
Drama and Theatre I, II

## නාට්‍ය හා රංගකලාව II

✻ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. **දික්තල කාලගෝල** නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   (i) දික්තල කාලගෝල නාට්‍යය රචනා කොට මුල්වරට නිෂ්පාදනය කරන ලද්දේ කවුරුන් විසින් ද? (ලකුණු 02 යි)
   (ii) එම නාට්‍ය පිටපත සංශෝධනය කොට 1975 වසරේදී නිෂ්පාදනය කරන ලද්දේ කවුරුන් විසින් ද? (ලකුණු 02 යි)
   (iii) මෙම නාට්‍යයේ පූර්වරංගය යටතේ ඉදිරිපත් කෙරෙන අංගය කුමක් ද? (ලකුණු 02 යි)
   (iv) දික්තල, කාලගෝල යන දෙදෙනා එකිනෙකා සමග නොගැළපීමට හේතු වන කරුණු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)
   (v) දික්තල කාලගෝල නාට්‍යයේ සංවාදවල ඔබ දකින විශේෂ ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (vi) නාට්‍ය අවසානයේ දී කාලගෝල ගයන ගීතයේ අදහස කුමක් ද? (ලකුණු 02 යි)

2. (i) චරිත නිරූපණයට උපකාර වන නළු සිරුරට සම්බන්ධ අභිනය **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) නාට්‍යවල දක්නට ලැබෙන චරිත වර්ග පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 04 යි)
   (iii) චරිත නිරූපණයේ දී නළු-නිළියන් විසින් සැලකිල්ලට ගත යුතු කරුණු මොනවා දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3. (i) රංගාලෝකය සඳහා භාවිත කෙරෙන විදුලි පහන් වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) රංගාලෝකය සපයාගැනීමට අතීතයේ භාවිත කළ උපක්‍රම මොනවා දැයි සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   (iii) වේදිකා නාට්‍යයකට රංගාලෝකය අවශ්‍ය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

4. (i) කෝලම් රඟ දැක්වුණ ප්‍රදේශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) කෝලම් රංග භූමියක රූපසටහනක් ඇඳ ඊට අයත් කොටස් නම් කරන්න. (ලකුණු 04 යි)
   (iii) සාම්ප්‍රදායික කෝලම් රංගයක චරිත ඉදිරිපත් කෙරෙන පිළිවෙළ සඳහන් කරන්න. (ලකුණු 06 යි)

5. (i) පූර්වරංගය යනු කුමක් ද? (ලකුණු 02 යි)
   (ii) නාඩගම්වල පූර්වරංගයේ දී කරළියට පිවිසෙන චරිත **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)
   (iii) නාඩගම් රඟ දැක්වීමට ආවේණික වූ ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06 යි)

6. (i) වීදි නාට්‍ය යනු කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)
   (ii) විවෘත වීදි නාට්‍ය කණ්ඩායම විසින් රඟ දක්වන ලද වීදි නාට්‍ය **හතරක** නම් සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   (iii) ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය කලාවේ පුරෝගාමියකු පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 06 යි)

7. පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කරගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කරගත හැකි ය.

   සුනිල් කතාන්දර ගොතා කීමට දක්ෂ ළමයෙකි. නාට්‍ය තරගයක් සඳහා ඉදිරිපත් කිරීමට නාට්‍යයක් නිපදවීමට ඔහු සූදානම් වෙයි. සුනිල් ගේ පන්තියේ මිතුරකු වන නිමල් රඟපෑමට දක්ෂ දඟකාර ළමයෙකි. දෙදෙනා එකතු වී නාට්‍යය පුහුණුවීමට සූදානම් වන විට ඒ බව ආරංචි වී දඩබ්බර හැඩි දැඩි සිසුවකු වන පුඩ්ඩි එතැනට පැමිණෙයි. ඔහු නාට්‍යයේ රජු ගේ චරිතය තමාට දිය යුතු බව කියාසිටියි.

   (i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)
   (ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)
   (iii) දෙගිඩියාව, කුතුහලය, උත්ප්‍රාසය සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

✻✻✻

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk